ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

**University of Sri Jayewardenepura**

බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය

**External Degrees and Extension Courses Unit**

# විශේෂ නිවේදනයයි

## 17 වන බාහිර උපාධි ප්‍රදානෝත්සවය

## 2023 සඳහා අයදුම්පත් කැඳවීම - අදියර I

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ 17 වන බාහිර උපාධි ප්‍රදානෝත්සවය 2023 දෙසැම්බර් මස 24 වන ඉරු දින කොළඹ 07, බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී පැවැත්වීමට කටයුතු සූදානම් කර ඇත.

පිරිනැමීමට නියමිත බාහිර උපාධි පිළිබඳ තොරතුරු පහත සඳහන් පරිදි වේ.

1. ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර උපාධිය (පැරණි නිර්දේශය)
2. ශාස්ත්‍රවේදී මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා (සාමාන්‍ය) බාහිර උපාධිය (නව නිර්දේශය)
3. ශාස්ත්‍රවේදී ඉංග්‍රීසි (සාමාන්‍ය) බාහිර උපාධිය
4. සමාජීය විද්‍යාවේදී පාරිසරික හා සංවර්ධන අධ්‍යයන (සාමාන්‍ය) බාහිර උපාධිය
5. වාණිජවේදී (සාමාන්‍ය) බාහිර උපාධිය (පැරණි නිර්දේශය)
6. වාණිජවේදී (සාමාන්‍ය) බාහිර උපාධිය (නව නිර්දේශය)
7. විද්‍යාවේදී කළමණාකරණ (රාජ්‍ය) සාමාන්‍ය (බාහිර) උපාධිය (නව නිර්දේශය)
8. විද්‍යාවේදී කළමණාකරණ (රාජ්‍ය) සාමාන්‍ය (බාහිර) උපාධිය (පැරණි නිර්දේශය)
9. විද්‍යාවේදී ව්‍යාපාර පරිපාලන (සාමාන්‍ය) බාහිර උපාධිය (නව නිර්දේශය)
10. විද්‍යාවේදී ව්‍යාපාර අධ්‍යනය (සාමාන්‍ය) බාහිර උපාධිය

මේ වන විට අවසාන වසර විභාග ප්‍රතිඵල නිකුත් කර ඇති විද්‍යාවේදී ව්‍යාපාර පරිපාලන (සාමාන්‍ය) බාහිර උපාධිය (නව නිර්දේශය), වාණිජවේදී (සාමාන්‍ය) බාහිර උපාධිය (නව නිර්දේශය) හා සමාජීය විද්‍යාවේදී පාරිසරික හා සංවර්ධන අධ්‍යයන (සාමාන්‍ය) බාහිර උපාධිය යන උපාධි පාඨමාලාවන්හි සිසුන් සඳහා අදියර I යටතේ උපාධි ප්‍රදානෝත්සවයට අදාල අයදුම්පත් කැඳවීම සිදුකරනු ලබන අතර, අවසාන ප්‍රතිඵල නිකුත් කරන පිළිවෙල අනුව සුදුසුකම් ලබන උපාධිලාභීන්ගේ අයදුම්පත් අදියර වශයෙන් කැඳවනු ලැබේ. ඒ අනුව 17 වන බාහිර උපාධි ප්‍රදානෝත්සවය සඳහා අදියර I යටතේ අයදුම්පත් කැඳවන උපාධිලාභීන්ගේ නාම ලේඛනය පහතින් දක්වා ඇත.

## Google Form හරහා එවිය යුතු ලේඛන

උපාධි ප්‍රදානෝත්සවයට අදාල Google Form 1 සහ 2 http://external.sjp.ac.lk යන වෙබ් අඩවියට පිවිස ඔබගේ ජාතික හැදුනුම්පත් අංකය "V" රහිතව යෙදීමෙන් සම්පූර්ණ කළ යුතුවේ.

**සම්පූර්ණ කර ලද Google Form 1 සඳහා උඩුගත (Upload) කළ යුතු ලේඛන**

1. සහතික කරන ලද උප්පැන්න සහතිකය
2. සහතික කරන ලද ජාතික හැදුනුම්පත යන ලේඛන දෙකෙහි Scan පිටපත් http://external.sjp.ac.lk යන වෙබ් අඩවියේ දක්වා ඇති Google Form 1 හරහා 2023 අගෝස්තු 31 දිනට පෙර ඉදිරිපත් (Submit) කල යුතු වේ.

## සම්පූර්ණ කර ලද Google Form 2 සඳහා උඩුගත (Upload) කිරීම.

Google Form 2 ලෙස දක්වා ඇති පසුවිපරම් පෝරමය (Feedback Form) 2023 අගෝස්තු 31 දිනට පෙර ඉදිරිපත් (Submit) කල යුතු වේ.

## ලියාපදිංචි තැපැල මඟින් එවිය යුතු ලේඛන

උපාධි ප්‍රදානෝත්සවයට අදාල අයදුම්පත් අංක 1 සහ 2 http://external.sjp.ac.lk යන වෙබ් අඩවියට පිවිස ඔබගේ ජාතික හැදුනුම්පත් අංකය "V" රහිතව යෙදීමෙන් බාගත (Download) කර ගත යුතුවේ.

බාගත කර ගත් අයදුම්පත නිසි ලෙස සම්පූර්ණ කර පහත සඳහන් ලේඛන සමඟ ලියාපදිංචි තැපැල මඟින් 2023 අගෝස්තු 31 දිනට පෙර **නියෝජ්‍ය ලේඛකාධිකාරී,බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය, තැපැල් පෙට්ටිය අංක 10, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ගංගොඩවිල, නුගේගොඩ** යන ලිපිනයට එවිය යුතුය. ලියුම් කවරයේ වම්පස කෙලවර "17 වන උපාධි ප්‍රදානෝත්සවය, උපාධි පාඨමාලාවේ නම සහ විභාග අංකය" සඳහන් කිරීම අනිවාර්ය වේ.

1. සම්පූර්ණ කර ලද අයදුම්පත් අංක 1 සහ 2
2. සහතික කරන ලද උප්පැන්න සහතිකයේ පිටපත
3. සහතික කරන ලද ජාතික හැදුනුම්පතෙහි පිටපත
4. බාහිර උපාධි ප්‍රදානෝත්සවය වෙනුවෙන් ගෙවීම් කරන ලද රිසිට්පත් තුනෙහි මුල් පිටපත්
    a) උපාධි ප්‍රදානෝත්සවය වෙනුවෙන් රු. 8000.00
    b) විස්තරාත්මක සහතිකය වෙනුවෙන් රු. 1000.00
    c) නැවත ගෙවනු ලබන උපාධි ලෝගුවේ තැන්පත් මුදල වෙනුවෙන් රු. 5000.00

**(ශ්‍රී ලංකාවේ ඕනෑම මහජන බැංකු ශාඛාවකට මුදල් ගෙවීම් සිදුකළ හැකි අතර CDM යන්ත්‍ර භාවිතයෙන් හා Online Payment මඟින් මෙම ගෙවීම් සිදු කළ නොහැක.)**

**සැ.යු. : ඔබ විසින් මේ වන විට විස්තරාත්මක සහතික පත්‍රය (Detailed Certificate) ලබා ගැනීමට ගෙවීම් කර අයදුම්පත එවා ඇති උපාධි අපේක්ෂකයෙකු නම් ඊට අදාල ගෙවීම් සිදු කිරීම හා ඔබගේ උප්පැන්න සහතිකය එවීම අවශ්‍ය නොවන අතර අයදුම්පතෙහි සඳහන් අනෙකුත් ගෙවීම් සිදුකර සම්පූර්ණ කර ලද අයදුම්පත එවීම අනිවාර්ය වේ.**



නියෝජ්‍ය ලේඛකාධිකාරී
බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය
2023-07-25

**(කාර්යාලයීය වේලාවන්හි පමණයි)**
**විමසීම්** - 0114846114/0113485404/0112881671
0113485402/0112881661
**Email – con.edecu@sjp.ac.lk**